**ජාතික පර්යේෂණ සභාව - 2021**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මතය

**---------**

ජාතික පර්යේෂණ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.960,252 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,295,913 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,256,165 ක යම් පිරිහීමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ වසර 05කින් නිම කළයුතු අතර 2014වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 05ක් අතරින් පර්යේෂණ 4ක් පමණක් අවසාන වී තිබුණි . ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීමේ පර්යේෂණය වසර 07ක් ඉක්මවා තිබුණ ද ,නිම වී නොතිබුණි. | TO 14-18 ව්‍යාපෘතියේ පර්යේෂකයන් නයා, කරවලා, තිත් පොළඟා, කුණකටුවා සහ වැලි පොළඟා යන සර්ප විශේෂ සඳහා එන්නතක් නිෂ්පාදනය කරන අතර මින් පළමු වැන්න නයා, තිත් පොළඟා, කුණකටුවා සහ වැලි පොළඟා යන සර්ප විශේෂ සඳහා නිෂ්පාදනය කරන ලදී. එහි සායනික අත්හදා බැලීම් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සාර්ථකව නිම කරන ලදී. කරවලා රහිතව එන්නත නිෂ්පාදනය කිරීමට හේතු | ව්‍යාපෘති නිමකළ යුතු වසර ගණන තුළ අදාළ ව්‍යාපෘති නිම කළ හැකිවන ලෙස සැළසුම් සකස් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර අදාළ කාල රාමුව තුළ ව්‍යාපෘති අවසන් කිරීමට |

| | | |
|---|---|---|
| | වූයේ 2018 අප්‍රේල් 20 වන දින තෙක් කරවල විෂ එකතු කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොදුන් හෙයිනි. කෙසේ වෙතත් අප අධ්‍යක්ෂක මණ්ඩලය උපදෙස් ලබා දුන්නේ සර්ප විශේෂ 5ම සඳහා නිෂ්පාදනය සිදු කරන ලෙසයි. 2018 අප්‍රේල් 20 වන දින ලබා දුන් අනුමැතිය මත සර්ප විෂ 2018 ජුලි මස 26 වන දින කොස්ට රිකා රාජ්‍යයේ Universidad de Costa Rica විශ්වවිද්‍යාලය වෙත යවා ඇත.<br>ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2020 ජුනි 26 වන දින ආනයන බලපත්‍රය ලබා දී ඇති අතර එන්නත් ගෙන්වීම සඳහා 2020 ජුලි 13 වන දින Universidad de Costa Rica විශ්වවිද්‍යාලය හට විශේෂ තත්ත්ව යටතේ ඉතා අඩු උෂ්ණත්වයකදී එරටින් මෙරටට කුරියර් කිරීම සඳහා ගෙවීම් සිදු කර ඇත.<br><br>නමුත් පැවති කොරෝනා තත්ත්වය මත ලෝකයේ ගුවන් ගමන් නැවතීම මත කුරියර් කිරීම කළ නොහැකි බව දන්වා ඇත. 2021 අප්‍රේල් 30 වන දින අප ආයතනයේ අනුමැතිය එම විශ්වවිද්‍යාලය හරහා වෙන කුරියර් සේවයක් වෙත ලබාදී ලංකාවට 2021 මැයි පළමු සතියේ පැමිණි අතර ඉන් පසු සායනික අත්හදා බැලීම් සිදු කිරීම ආරම්භ කළ අතර ඒ සඳහා සභාව මගින් අවසර ලබා දී ඇත. ඉහත සඳහන් කළ සාධාරණ හේතු මත අප අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ව්‍යාපෘති කාලය දිගු කිරීම සඳහා කටයුතු කරන ලදී. | හැකිවන ලෙස කටයුතු කළ යුතුය. |
| (ආ) TO-14-04 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ඩෙංගු වාහකයන් පාලනය කිරීම සඳහා නව කීට ප්‍රභේදයක් සොයාගෙන තිබුණද එම කීටයන් රට තුළ ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්ධනය කිරීමේ සැළැස්මක් ක්‍රියාත්මක කිරීම සිදුවන්නේද යන්න පිළිබඳ අධීක්ෂණයක් ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකිරීම හා ඒ සඳහා පසුවිපරම් කිරීමට අවධානය යොමුකර නොතිබුණි. මේ නිසා උක්ත පර්යේෂණය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | TO 14-04 ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්දන ඒකකය සමඟ සෘජුව කටයුතු කරන අතර ඒ සඳහා එම ඒකකයේ ප්‍රධානියාද සහභාගී වේ. මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් සිසුන් දැනුවත් කිරීම සඳහා යොදා ගනු ලබයි. පාසල් වල ගුරු අත්පොත් සඳහා මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් සිසුන් දැනුවත් කිරීම සඳහා යොදා ගනු ලබන අතර ජාතික ඩෙංගු මර්දන ඒකකය අප ව්‍යාපෘතියේ පර්යේෂකයන් සමඟ ඩෙංගු ව්‍යාප්තිය අවම කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘති සිදු කරන අතර ඒ සඳහා එම ඒකකයේ අධ්‍යක්ෂතුමා සහභාගී වනු ලබයි. | පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) TO-14-05 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් රු.47,001,209 ක් වැයකර නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තිබූ අතර එහි ප්‍රතිඵලය ලෙස වකුගඩු රෝගය වැළඳීමට හේතුව පානීය | TO 14-05 ව්‍යාපෘතියේ මූලික සොයා ගැනීම වන්නේ වකුගඩු රෝගය සඳහා කැල්සියම් හෝ මැග්නීසියම් සමඟ ෆ්ලෝරයිඩ් ජලයේ පැවතීම වන අතර ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර මෙම ව්‍යාපෘතියේ | පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි |

| | | |
|---|---|---|
| ජලය තුළ ෆ්ලෝරයිඩ්, කැල්සියම් හා මැග්නීසියම් සංඝටක ඇතුළත්වී තිබීම බව සොයාගෙන තිබුණද එම සංඝටක පානීය ජලය තුල ඇතුළත්වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාළවන ආයතන සම්බන්ධ කර ගැනීම නිසිපරිදි සිදු නොවීම නිසා පර්යේෂණයේ ප්‍රතිඵලය ජාතික අවශ්‍යතාවයට යොදාගැනීම මන්දගාමීවී හෝ මගහැරී ඇති බවත් ඒ පිළිබඳ පසුවිපරම් කිරීම පිළිබඳ ජාතික පර්යේෂණ සභාව අවධානය යොමුකර නොතිබුණ බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | සොයා ගැනීම් මහනුවර මහ රෝහලේ වකුගඩු ඒකකය දැනට භාවිතා කරන අතර උතුරු මැද පළාතේ වකුගඩු රෝගයට හේතුවක් වන පිරිසිදු ජල ප්‍රශ්නය නිරකරණය සඳහා අපගේ TO 16-15 ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන මණ්ඩලය හා එක්ව මේ වන විට කටයුතු කරන අතර ඔවුන් දැනටම ජල පිරිපහදු කිහිපයක් නිපදවා පරිභෝජනයට ලබා දී ඇත. වෙළඳපොළ ජල පෙරහන් වෙනුවට මෙම රෝගයට සුදුසු පෙරහනක් නිර්මාණය කිරීම TO 16-18 ව්‍යාපෘතියෙන් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මගින් සොයා ගත් ජීව ලකුණු (Biomarkers) මහනුවර මහ රෝහලේ අධ්‍යක්ෂතුමා විසින් ලිපියක් මගින් දන්වා ඇත. | ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කළ යුතුය. |
| (ඈ) පර්යේෂණ ව්‍යාපෘති අංක TO-14-10 මගින් රු. 41,723,915 ක් වැයකර කිරි නිෂ්පාදනය අතින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීම සඳහා වූ පර්යේෂණය 2020 වර්ෂයේ නිම කර තිබුණ ද, පර්යේෂණය මගින් හඳුනාගත් තාක්ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමක් ආයතනය සිදුකර නොතිබුණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි. | TO 14-10 ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ කිරි වලින් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීම සඳහා කළ යුතු දේ නිර්දේශ කිරීම වන අතර ඔවුන් තම ව්‍යාපෘතිය මගින් එය සිදු කළ අතර ව්‍යාපෘතිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල වල සිදු කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් (Progress review meeting) සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පශු සම්පත් සහ ගොවිපල ප්‍රවර්ධනය සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී වූ අතර ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් මගින් මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් මින්සුන් අතර ප්‍රචලිත කර කිරි වලින් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරන බවට දන්වා ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ රිදී ගම ගොවිපලෙහි කිරි ගවයන් අභිජනනය සඳහා මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් භාවිතා කරන අතර ඒ සඳහා ව්‍යාපෘතියේ පර්යේෂකයන් සහභාගී වී ඇත. | පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා වූ පරීක්ෂණය ක්ෂේත්‍ර භෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට ලබාදී තිබූ අතර පර්යේෂණයෙන් වැඩිදියුණු කළ වී, බඩඉරිඟු, මුං ඇට හා අමු මිරිස් | TO 14-24 ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ලංකාවේ කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිස් එහි ප්‍රතිඵල භාවිතයට ගන්නා අතර කෘෂිකර්ම අමාත්‍යාංශය තම නිෂ්පාදන ගොවීන්ට ගෙන යන ව්‍යාපෘති හරහා දැනටම ක්‍රියාත්මක අතර ඒ සඳහා පෞද්ගලික ආයතන හා එක්ව කටයුතු කරයි. ඔවුන්ගෙන් අප මේ වන විට වර්තමාන ප්‍රගතිය විමසා යවා ඇත. | පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීම තුලින් රටට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීම හා අධීක්ෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රභේද පිළිබඳ ප්‍රතිඵලය සමාජගත කිරීම හා එහි ප්‍රගතිය ජාතික පර්යේෂණ සභාව වෙත ලබාගැනීම, ඇගයීම හා පසුවිපරම් කිරීම සිදුවී නොතිබුණි. | | |
| (ඊ) පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරන වියදම් ආයෝජනයන් ලෙස ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කිරීම ආයතනයේ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණද , උක්ත පර්යේෂණ වියදම් ආයෝජන ලෙස භාවිතා කිරීමට හෝ ආදායම් උත්පාදනය කිරීමට යොමු කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් නොමැති බව නිරීක්ෂණය විය. | පර්යේෂක විසින් ව්‍යාපෘති ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව ව්‍යාපෘති යෝජනාවේ සටහන් කර ඇති අතර අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අදාල අමාත්‍යාංශ වල නිලධාරීන් ව්‍යාපෘති වල ඇගයීම් හමු සඳහා සහභාගී වූ අතර එම අමාත්‍යාංශ වල ලේකම්වරු හට දැනටම මෙම ව්‍යාපෘති පිළිබඳව දන්වා යවා ඇති අතර ව්‍යාපෘති වල සොයාගැනීම් අප ආයතනයේ වෙබ් අඩවිය තුලද පලකර ඇත. ජාතික පර්යේෂණ සභාවේ පනත ප්‍රකාරව කර්තව්‍ය වන්නේ රටට ප්‍රයෝජනයක් සහිත ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලබා දීම, පහසු කරලීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය කිරීම වන අතර අප ආයතනය අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපරිම උත්සාහය යොදනු ලබයි. පසුගිය අප්‍රේල් 27 වන දින අප ආයතනය හා අප අමාත්‍යාංශ සමඟ පැවති සාකච්ඡාවකදී මෙම ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා සිදු කළ අතර ඒ සඳහා අමාත්‍යාංශ යම් පියවරක් ගන්නා බව දන්වා සිටින ලදී. | පර්යේෂණ වියදම් තුලින් උපරිම ප්‍රතිඵල ලැබෙන අයුරින් පර්යේෂණ ප්‍රතිඵල ඵලදායීව භාවිතා කිරීමට විධිමත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් වැය වන ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ සඳහා ඇස්තමේන්තුගත වියදම් සිදුවන කාල රාමු හඳුනාගැනීම හා ඒ අනුව අග්‍රිම අවශ්‍යතා සැලසුම් සකස් කර ප්‍රදාන ලබාගෙන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2021දෙසැම්බර් 31දින වන විට අවුරුදු 03 සිට 07 දක්වා කාල පරාසය තුළ උපයෝජනය නොවූ එකතුව රු.64,306,587 ක් (පර්යේෂණ 05 ක් සඳහා අදාළ) ජංගම ගිණුම්වල පැවතුණි. | වසර 5ක් සඳහා ලබාදෙන ඉලක්කගත බහුවිධ පර්යේෂණ ප්‍රදාන සඳහා අපගේ මාර්ගෝපදේශය මඟින් ඔවුන්ට වසරේ සුදුසු කාලයක සුදුසු ආකාරයට මුදල් යොදවා පර්යේෂණ සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇත. මෙහි අභාවිත කාල ලෙස සටහන් කිරීම නිවැරදි නොවන අතර එම ව්‍යාපෘති සියල්ල තවදුරටත් සිදු කරමින් පවතින පර්යේෂණ වේ. තම ව්‍යාපෘති සඳහා එම මුදල් පර්යේෂකයින් විසින් භාවිතා කිරීම පර්යේෂණ යෝජනාවේ ඇති කාල රාමුව තුල සිදුවේ. | පර්යේෂණ සඳහා ලැබෙන මුදල් වලින් උපරිම ඵලදායීතාවය ලැබෙන පරිදි අරමුදලක් පිහිටුවීම වැනි ක්‍රමවේදයකට යොමුවිය යුතුය. |